දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2012 පෙබරවාරි
# First Examination in Arts (External) - February 2012

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
## PS 1.2 - Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න.

---

(01) උපක්‍රම, නායකත්වය සහ ලබාගත් ජයග්‍රහණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව සාකච්ඡාවක් කරන්න.

(02) (අ) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කළ විධායක කාරක සභා ක්‍රමයේ මූලික අරමුණු මොනවා ද?
(ආ) ඒවා ප්‍රායෝගික වශයෙන් කෙතරම් ඉටු වී ද?

(03) "පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සහ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය" යන මැයෙන් විවේචනාත්මක රචනයක් ලියන්න.

(04) "1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ වැදගත්ම දේශපාලන ආයතනය ජාතික රාජ්‍ය සභාව විය." ඔබ එකඟ වන්නේ ද? හේතු සහිතව පැහැදිලි කරන්න.

(05) 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නියෝජන ක්‍රමයේ වාසි සහ අවාසි පෙන්වා දී එම අවාසි මගහැරවීමට ඇති පිළියම් යෝජනා කරන්න.

(06) "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති සමස්ථ ආණ්ඩු ක්‍රමයේ ම නායකයා වේ." සාකච්ඡා කරන්න.

(07) වත්මන් ප්‍රවනතා කෙරෙහි අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳව විචාරාත්මක රචනයක් ලියන්න.

(08) ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා සම්බන්ධයෙන් පහත කරුණු විභාග කරන්න.
(i) 2005 න් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය
(ii) ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලාංකීය රාජ තාන්ත්‍රික සේවාවේ භූමිකාව

(09) "2009 මැයි මාසයේ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ) පරාජය කිරීමෙන් පසුව උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පවතින්නේ යුද්ධයක් නොමැති තත්වයකි." ඔබ එකඟ වන්නේ ද? විවේචනාත්මකව විග්‍රහ කරමින් චිරසාර සාමයක් ළඟාකර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග මොනවා දැයි පෙන්වා දෙන්න.

(10) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.
(i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සංශෝධනය අහෝසි කිරීම
(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කල 18 වන සංශෝධනය
(iii) දරුස්මාන් වාර්තාවෙන් එල්ලවන යුධ අපරාධ චෝදනා සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ භූමිකාව
(iv) ඌණ ක්‍රියාකාරී සහ ඌණ උපයෝගිතා වත්කම් පවරා ගැනීමේ පනත

♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦♦